# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>
# <u>(2018.01.01 දින සිට 2018.03.31 දින දක්වා</u>)

මුදල් කොමිෂන් සභාව විසින් 2018 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට මාර්තු 31 දින දක්වා සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් මෙම වාර්තාව මගින් ආවරණය කෙරේ.

## 01. පළාත් සභාවන් වෙත ඉදිරි වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතාවයන් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම

සෑම වර්ෂයකදීම මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වල ප්‍රාග්ධන හා පුනරාවර්තන ක්‍රියාකාරකම්වල අවශ්‍යතා තක්සේරුව සම්බන්ධයෙන් පළාත් වෙත මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි. මේ සඳහා ආකෘති පත්‍රයක් සකස් කර ඇත.

2019 වර්ෂය සඳහා අවශ්‍යතා තක්සේරුව පිළිබඳ මාර්ගෝපදේශ පළාත් වෙත යවන ලද අතර, 2019 වර්ෂය සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වල අවශ්‍යතා තක්සේරුව සම්බන්ධ පළාත් සභාවන්හි ඉල්ලීම් 2018 මැයි මස 31 වන දින වන විට මුදල් කොමිෂන් සභාව වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 02. පළාත් වෙතින් 2018 වර්ෂයේ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ලැබීම

සියළුම පළාත් වලින් 2018 වර්ෂයේ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. මෙම වර්ෂයේ දී මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම් අදාල අනෙකුත් නිලධාරීන් සමග සංවර්ධන සැලසුම් විමර්ශනය හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති නිරීක්ෂණය කිරීම සඳහා පහත සඳහන් දිනයන්වල දී පළාත්වල සංචාරය කරන ලදී. එම රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම්වරුන් සහ පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රධානීන් ඇතුළත්ව අනෙකුත් වගකිව යුතු නිලධාරීන් සහභාගීවන ලදී.

- බස්නාහිර පළාත - 2018 පෙබරවාරි 26
- නැගෙනහිර පළාත - 2018 මාර්තු 02
- වයඹ පළාත - 2018 මාර්තු 05
- දකුනු පළාත - 2018 මාර්තු 09
- මධ්‍යම පළාත - 2018 මාර්තු 14
- සබරගමුව පළාත - 2018 මාර්තු 15
- ඌව පළාත - 2018 මාර්තු 19
- උතුරු පළාත - 2018 මාර්තු 26
- උතුරු මැද පළාත - 2018 මාර්තු 27

**පළාත්වල ක්ෂේත්‍ර නිරීක්ෂණයන්ට අදාල තෝරාගත් ඡායාරූප**

**නැගෙනහිර පළාත**



**අගය එකතු කිරීමේ සහ ආදර්ශණ ඒකකය ස්ථාපනය කිරීම**

**උතුරු පළාත**



**තලෛමන්නාරම - රෝහල**

**මධ්‍යම පළාත**




**ජීව වායු ඒකකය**

**වයඹ පළාත**



**හෝටල් පාසල**

ඇතැම් ව්‍යාපෘති හා සම්බන්ධ ගැටළු නිරීක්ෂණය කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර ඇත.

## 03. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාවය ලබාදීම

එකඟවූ පරිදි ඇතැම් සංශෝධනවලට යටත්ව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සියලුම පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා එකඟතාවය ලබාදී ඇත.

## 04. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016 / 2017

2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අතිගරු ජනාධිපතිතුමා සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කෙරෙමින් පවතී.



2018 පෙබරවාරි මස 15 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී මුදල් කොමිෂන් සභාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත භාරදෙන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපති උදිත එච් පලිහක්කාර මහතා විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා, මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග මහතා, කනගසභාපති මහතා, මහාචාර්ය සෆ්රුල්ලා මහතා සහ මුදල් කොමිෂන් සභාවේ ලේකම් ඒ.ටී.එම්.යූ.ඩී.බී.තෙන්නකෝන් මහතා සහභාගිවන ලදී.

## 05. පළාත් විගණන වාර්තා පිළිබඳ වාර්තා සැකසීම

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද වයඹ හා දකුණු පළාත්වල විගණන වාර්තා අධ්‍යයනය කරන ලද අතර, පළාත්වල වගවීම වැඩිදියුණු කිරීමේ මතයක් ද සමග මුදල් කොමිෂන් සභාවේ නිරීක්ෂණ පළාත් ප්‍රධාන ලේකම් වරුන් වෙත යවන ලදී.

## 06. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම

මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. සෑම මසකටම මුදල් කොමිෂන් සභාවේදී ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පවත්වන ලද අතර, කොන්ත්‍රාත්කරුගේ සහ ව්‍යාපෘති උපදේශන ඒකකයේ (වාස්තු විද්‍යාපීඨය, මොරටුව විශ්ව විද්‍යාලය) සහභාගිත්වයෙන් වැඩබිමේ දී තාක්ෂණික කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. 2018 වර්ෂය සඳහා වෙන් කරන ලද රු.මි 180 ක මුදලින් පළමු කාර්තුව අවසානයේදී රු.මි.14.7ක් ගෙවා ඇත. මෙම ව්‍යාපෘතිය දින 96 ක පමණ ප්‍රමාදයක් සහිතව ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වේ. ඉදිකිරීම් ව්‍යාපෘතිය 2018 මැයි මස වන විට අවසන් කිරීමට නියමිත වේ.

 

**07. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය**

මුදල් කොමිෂන් සභාවේ භාවිතය සඳහා දත්ත පද්ධතිය / කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) සහ ආසියානු පදනම සමග රැස්වීම් වාර ගණනාවක් පවත්වා ඇත.මේ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව හා ආසියා පදනම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත. මුදල් කොමිෂන් සභාවේ ලේකම් විසින් මුදල් කොමිෂන් සභාවේ බලයලත් නිලධාරියෙකු ලෙස අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. එම අවබෝධතා ගිවිසුම බලයලත් නිලෙධාරියෙකුගේ අත්සන සඳහා ආසියානු පදනම වෙත යවන ලදී. මේ අතර, පුනරාවර්තන වියදම් හා පළාත් ආදායම් සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාවේ වර්තමාන ක්‍රියාවලිය පිළිබඳව UCSC විසින් ඔවුන්ගේ අධ්‍යයනය ආරම්භ කර ඇත.

**08. අභ්‍යන්තර විගණන කමිටුව**

අභ්‍යන්තර විගණන කමිටුවේ පළමු කාර්තුවේ රැස්වීම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ සහභාගිත්වයෙන් 2018 පෙබරවාරි මස 27 වන දින පවත්වන ලදී.අවශ්‍ය වන පසුවිපරම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම රැස්වීමේදී ගනු ලැබූ තීරණ මුදල් කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය වෙත දැනුම්දෙන ලදී. අභ්‍යන්තර විගණනය, අදාල කටයුතු විධිමත් කිරීමට අමතරව කාර්ය සාධනය උදෙසා ද විය යුතු බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

**09. අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලැබූ නිර්දේශයන් පසු විපරම් කිරීම**

අතිගරු ජනාධිපතිතුමා වෙත යවනු ලැබූ නිර්දේශ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ ඉල්ලීම මත ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසින් අවස්ථාවක් සලසා දෙන ලදී. මුදල් කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය නිර්දේශ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මධ්‍යම රජයේ අමාත්‍යාංශවල හා පළාත් සභාවල අදාල නිලධාරීන් සමග රැස්වීමක් කැඳවීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ජනාධිපති ලේකම්තුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

## 10. ස්වාධීන කොමිෂන් සභා සම්බන්ධ කටයුතු පිළිබඳ රැස්වීම

2018 පෙබරවාරි මස 02 දින ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතාගේ ආරාධනයෙන් කොමිෂන් සභාවන්හි නියෝජිතයින් සමග ජනාධිපති ලේකම් කාර්යාලයේදී රැස්වීමක් පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ ලේකම් ද එම රැස්වීමට සහභාගිවන ලදී.

මෙම රැස්වීමේ අරමුණ වූයේ සියළුම නියෝජිතයින් හට ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමට හා අවශ්‍ය නිර්දේශ ලබාගැනීම සඳහා අවස්ථාව ලබාදීමයි.

## 11. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තා

2018 ජනවාරි මස 18 වන දින 2017 වර්ෂයේ අවසන් කාර්තුවේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

## 12. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

### 12.1. ආරාධිත දේශන

පහත සඳහන් ආරාධිත දේශකයන් මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

| අංකය | නම | මාතෘකාව | දිනය |
|---|---|---|---|
| 01 | මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය | Vision 2025 | 2018 ජනවාරි 02 |
| 02 | ඩී. එන්. එස්. කුරුප්පුමුල්ලගේ මහතා<br>ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ Ind-expo of Certification Institute සහ හිටපු අධ්‍යක්ෂ ජනරාල් , පේෂකර්ම හා ඇඟලුම් ආයතනය | කාල හා ආතති කළමනාකරණය | 2018 ජනවාරි 05 |
| 03 | ආර්. එම්. එස්. පී . රත්නායක මහතා, රථ වාහන පොලීසිය, බම්බලපිටිය | මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2018 ජනවාරි 30 |
| 04 | ඩේවිඩ් බැක්ස්ටර් මහතා<br>විශේෂඥ USAID | රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය | 2018 පෙබරවාරි 01 |
| 05 | ආචාර්ය පී.ජී.කිරිවන්දෙණිය මහතා, හිටපු සභාපති සණස සංවර්ධන බැංකුව | ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය | 2018 පෙබරවාරි 07 |
| 06 | ඩබ්. සී. ධීරසේකර මහතා<br>External Collaborator - ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) ශ්‍රී ලංකා සහ හිටපු ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය | පළාත් සහා හරහා ආහාර වටිනාකම දාම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම | 2018 මාර්තු 06 |
| 07 | ලක්ෂමන් ජයසේකර මහතා<br>ව්‍යාපෘති අධ්‍යක්ෂ<br>බස්නාහිර පළාත් නගර සැලසුම් ව්‍යාපෘතිය | බස්නාහිර පළාත් නගර සැලසුම් ව්‍යාපෘති පිළිබඳ දළ විශ්ලේෂණයක් | 2018 මාර්තු 13 |




**ආර්. එම්. එස්. පී . රත්නායක මහතා**
**රථ වාහන පොලීසිය , බම්බලපිටිය**




**ඩේවිඩ් බැක්ස්ටර් මහතා - විශේෂඥ USAID**




**ආචාර්ය පී.ඒ.කිරිවන්දෙණිය මහතා**
**හිටපු සභාපති-සණස සංවර්ධන බැංකුව**




**ඩබ්. සී. ධීරසේකර මහතා - External Collaborator - ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) ශ්‍රී ලංකා සහ හිටපු ලේකම් - කර්මාන්ත අමාත්‍යංශය**




**ලක්ෂමන් ජයසේකර මහතා- ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**බස්නාහිර පළාත් නගර සැලසුම් ව්‍යාපෘතිය**



**මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා - සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව , කොළඹ විශ්ව විද්‍යාලය**

**12.2. කාර්ය මණ්ඩල අධ්‍යයන**

පහත දැක්වෙන මුදල් කොමිෂන් සභා නිලධාරීන් විසින් කාර්යාලීය නිලධාරීන් සඳහා පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

| නම | | මාතෘකාව |
|---|---|---|
| • ආර්. ඒ. එස්.කේ. රණසිංහ මහතා<br>ප්‍රධාන ගණකාධිකාරී | - | පළාත්වල ආදායම් උත්පාදනය |
| • එස්. එම්. ආර්. එස්. බණ්ඩාර මහතා<br>අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන) | - | මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය 2025 දැක්ම ක්‍රියාත්මක කිරීම |
| • නිශාන්ත සුජීව මහතා<br>සහකාර අධ්‍යක්ෂ | - | ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2017 |
| • එරන්දි ගුණසේකර මිය<br>සහකාර අධ්‍යක්ෂ | - | 2025 දැක්ම |
| • නවෝදනී අබේසූරිය මිය<br>සංවර්ධන නිලධාරි | - | ප්‍රාග්ධන වියදම |
| • මංගල බණ්ඩාර මහතා<br>සංවර්ධන නිලධාරි | - | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය |

## 13. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීමේ රැස්වීම

ජාතික සැළසුම්කරණ දෙපාර්තමේන්තුව හා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතනවල අධ්‍යක්ෂකවරුන් සමඟ 2018 මාර්තු මස 13 වැනි දින මුදල් කොමිෂන් සභාවේ දී රැස්වීමක් පැවැත්විනි.

රැස්වීමෙහි ප්‍රධාන අරමුණ වූයේ මුදල් කොමිෂන් සභාවේ අරමුදල් බෙදා වෙන්කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීම සඳහා සහභාගීවන්නන්ගේ නිරීක්ෂණ ලබා ගැනීම හා ඒ ඒ ආයතන සතුව ඇති දත්ත හා තොරතුරු හුවමාරු කර ගැනීමයි.

## 14. 2018 සඳහා ක්‍රියාකාරි සැලැස්ම

2018 සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව සකස් කර ඇති අතර එය දැනටමත් මුදල් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

## 15. උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය

මුදල් කොමිෂන් සභාවේ වත්මන් උපායමාර්ගික සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර උපාය මාර්ගික සැලැස්ම හා සමගාමීව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. උපාය මාර්ගික සැලැස්ම ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමඟ සමාලෝචනය කරන ලදී.

## 16. මුදල් කොමිෂන් සභා පනතේ කෙටුම්පත

මෙම පනත සකස් කර අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. මෙම කෙටුම්පත සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් යම් නිරීක්ෂණ ඉදිරිපත් කළ අතර, මුදල් කොමිසම ඊට ප්‍රතිචාර දක්වන ලදී. අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේ.

2018 ජනවාරි මස 2 වැනි දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේ දී අවශ්‍ය නීති සම්පාදනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකවරයාගෙන් උපදෙස් ලබාගැනීම තීරණය විය.

## 17. දොරොව්ව් ගමේ ජල සැපයුම



බස්නාහිර පළාතේ සහ මුදල් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ දොරොව්ව ගම්මානයේ ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ජල සැපයුම් ටැංකි ඉදිකර ඇත. ව්‍යාපෘතිය සඳහා විකල්ප ජල ප්‍රභවයක් තිබිය යුතුය. මෙම ගැටළුව සඳහා විධිමත් විසඳුමක් සොයා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාව තීරණය කර තිබේ.

## 18. විශේෂ අධ්‍යයනයන්

මුදල් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සඳහා විශේෂ අධ්‍යයනයන් රාශියක් සිදු කරන ලදී. ඒවාට ඇතුළත් වන්නේ:

- නව අරමුදල් බෙදා වෙන් කිරීමේ සංඛ්‍යානමය ක්‍රමවේදය සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ අන්තර් රාජ්‍ය මූල්‍ය සම්බන්ධතා
- ශ්‍රී ලංකාවේ පළාත් ආදායම්
- පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම
- පළාත් සභා, පළාත් පාලන ආයතන සහ පළාත් පාලන ආයතන කාර්යමණ්ඩල

## 19. සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගී වීම

මුදල් කොමිෂන් සභාවේ  සභාපති, ලේකම් සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය පහත සඳහන් රැස්වීම් / වැඩමුළු සඳහා සහභාගී විය.

- තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ ශ්‍රී ලංකා පාර්ශ්වකරුවන්ගේ සමාරම්භක රැස්වීම.
- වෘත්තිකයින් සඳහා අත්‍යාවශ්‍ය නායකත්ව කුසලතා
- ශ්‍රී ලංකාවේ අනාගතය
- ලෝකය සහ කලාපය තුළ ඩිජිටල්කරණය
- විගණකාධිපති ජනරාල් වාර්ෂික වාර්තාව -2016
- මාර්ග සිතියම 2018 - ශ්‍රී ලංකා මහ බැංකුව
- ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ග
- වරාය නගරය සහ ශ්‍රී ලංකාවේ අනාගතය
- මානව හිමිකම් පිළිබඳ ආංශික කමිටුව
- නගර සැලසුම්කරණය හා සංවර්ධනය
- දේශීය සංවර්ධන උපයෝගීතා ව්‍යාපෘතිය සඳහා පිළියෙල කරන ලද පාර්ශ්වකරුවන්ගේ රැස්වීම
- දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය
- පුර නැගුම පළාත් පාලන වැඩිදියුණු කිරිමේ ආංශික ව්‍යාපෘතිය
- උතුරු මාර්ග සම්බන්ධතා  ව්‍යාපෘතිය
- උතුරු පළාත් සංවර්ධන සැලැස්ම

## 20. සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීම

2018 මාර්තු 26 දින කොමිෂන් සභා කාර්යාලයට සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.

## 21. කොමිෂන් සභා රැස්වීම්

• පහත දැක්වෙන පරිදි කොමිෂන් සභා රැස්වීම් පැවැත්විණි.

➢ 2018 ජනවාරි මස 24 වන දින

➢ 2018 පෙබරවාරි 22 දින

• සෑම කොමිෂන් සභා රැස්වීමක්ම පැවැත්වීමට පෙර කොමිෂන් සභා උප කමිටුව රැස්වෙන ලදී.

• විධායක නිලධාරීන්ගේ රැස්වීම් - සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම් අඛණ්ඩව පවත්වන ලදී.